# අලි බබා සහ හොරු 225 පන්නමු !

# ජන අරගලයට පනපොවමු !

පළාත් පාලන ඡන්දය කල් දැමීම සඳහා රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාගේ සියලු කුමන්ත්‍රණ පරාජයවී තිබෙනවා. මෙම ඡන්දය පැවැත්වීම වත්මන් පාලකයින්ගේ භූමිදානයට දින තීන්දු කිරීමක්, රනිල් වික්‍රමසිංහගේ මාමා වූ ජේ.ආර්.ජයවර්ධනගේ උපායන් අනුගමනය කරමින් ඇති කරනු ලැබූ කුමන්ත්‍රණවලට ආයුෂ නොමැති බව මෙමගින් සනාථ වී තිබෙනවා. ඔහුගේ උපායන් ජයගත්තේ නම් පසුගිය මාර්තු -ජූලි අරගලය වැනි තත්ත්වයක් නිර්මාණය වීමට තිබුණා.

වත්මන් මැතිවරණය පවත්වන්න වන්නේ ඉතිහාසයේ දැවැන්තම සමාජ ව්‍යසනයකට පසුබිම නිර්මාණ වී ඇති අවස්ථාවකයි. මෙම ව්‍යසනයට පාලකලයින්ට කිසිඳු විසඳුමක් නොමැති බව ජනතාවගේ බහුතරය තේරුම් ගනිමින් තිබෙනවා. එක් පැත්තකින් දැවැන්තම ණය කන්දකට රට ඇදදමලා. එය ඩොලර් ට්‍රිලියන 12 ඉක්මවමින් තිබෙන බව වාර්තා වෙනවා. දිනෙන් දින ඇතිවන ආර්ථික කඩා වැටීම අතිශය භයානකයි. ඉදිරි මාස වලදි තවත් මෙය වැඩිවෙනවා මිස අඩුවීමක් නැති බව සියලු ආර්ථික දත්ත මගින් පෙන්වා දි තිබෙනවා. රටේ දරුවන් විශාල ප්‍රතිශතයක් මන්දපෝෂණයට ගොදුරු වෙලා. ජනතාවගේ 1/3 උග්‍ර ආහාර අහේනියක පසුවන අතර 80%ක් එක් කෑම වේලක් හෝ අතහරිමින් සිටින බව ලෝක බැංකු ඇතුලු ජාත්‍යාන්තර සංවිධාන දැනටමත් පෙන්වා දී තිබෙනවා. ආහාර අද්ධමනය 90% ඉක්මවා තිබෙන අතර විදුලිය, ජලය, දුරකථන ඇතුලු සියලු සේවාවන් වැඩිවන්නේ මිනිසාට දරාගන්නට වීනා හිතා ගන්නටත් බැරි මට්ටමකින්.

මේ අතර අති විශාල බදු කන්දක් ජනතාව මත පටවා ඇති අතර එය ඉදිරියට තව තවත් ඉහළ යාම කිසිවෙකුටත් නොවැලැක්විය හැක. ශ්‍රී ලංකාව දැනටමත් බංකොළොත් රාජ්‍යයක් බවට ජාත්‍යාන්තරය පිළිගෙන ඇති තත්ත්වයක් තුළ ලංකාවට ආයෝජනයන් ගලා ඒමද අඩුවී තිබෙනවා.

මෙම සියලු තත්ත්වයන් හමුවේ වැඩිවශයෙන්ම පීඩාවට පත්වන්නේ දුගී දුප්පත් ජනතාවයි. ඔවුන් සිය ජීවන අරගලය ඉදිරියට ගෙන යාම සඳහා දැනටමත් මාරාන්තික සටනක යෙදී සිටින අතර ඉදිරියේදී මෙම පිරිස මරාගෙන මැරෙන සටනකට අවතීර්ණ වීම කිසිවෙකුටවත් නැවැත්විය නොහැක. රාජ්‍ය සේවකයන් 80% වැඩි ප්‍රතිශතයක් ඉතා සුළු වැටුපක් ලබන ශ්‍රේණිවලට අයත්වන අතර අදවන විට ඔවුන් නම්බුකාර හිගන්නන් බවට පත්වී තිබෙනවා. කර්මාන්ත බිඳ වැටීම හමුවේ තරුණ තරුණයන්ට රැකියාවක් සොයා ගැනීමට අතිශ්‍ය අමාරු වන අතර ඔවුන් ආණ්ඩුව සමඟ නොනවතින අරගලයකට පිවිසීම කාලය පිළිබඳ ප්‍රශ්ණයක් පමණයි.

මෙම තත්ත්වය තුළ අපි මෙවර පළාත් පාලන මැතිවරණය සඳහා ඉදිරිපත් වී සිටින්නේ මෙම මතුවන ජන විරෝධයට ගම්වල හා නගරයේ ජනතාවට මඟ පෙන්විය හැකි නායකත්වයක් ගොඩ නැගීම සඳහාය.

**මැතිවරණයේදී ජනතාව ගතයුතු මඟ**

පළාත් පාලන මැතිවරණය විවිධ හේතු කියාපාමින් කල් දැමීමට පාලකයින් කුරුමාණම් අල්ලමින් සිටියා. එම කුරුමාණම් සියල්ල අසාර්ථක වූ නිසා පාලකයින්

අකමැත්තෙන් හෝ ඡන්දය පැවැත්වීමට සිදුවී තිබෙනවා. රනිල් වික්‍රමසිංහගේ නායකත්වය මත යැපෙමින් රාජපක්ෂලා ආරක්ෂා වීමටගත් උත්සහය ඡන්ද ප්‍රතිඵල සමඟ නිමා වෙනවා.

පසුගිය දශක ගණනාව තුළ පාලකයින් කියා සිටියේ ගෝලීය ප්‍රාග්ධනය රට තුලට වඩ වඩා ගලා ඒමට සලස්වා එමගින් වැඩි වැඩියෙන් ඉදිකිරීම් මාර්ග ආර්ථිකය සංවර්ධනය උත්තේජනය කරන බවයි. මේ ඉදිකිරීම් කොළඹ බස්නාහිර පළාත් කේන්ද්‍ර කර ගනිමින් සිදු කරන බවද පවසා සිටියා. දැවැන්ත මෙගා පොලිස් නාගරික ව්‍යාපෘති අතර ප්‍රධාන පෙළේ නිවාස යෝජනා ක්‍රම හා අධිවේගී මාර්ග මත කරන ආයෝජන දිගටම පවත්වාගෙන යාමට ක්‍රියා කරන බවට කීවා. මෙහි දෙවන පියවර ලෙස පෙන්වාදුන් කොළඹ ගෝලීය ප්‍රාග්ධණ වෙලඳපොළ මූල්‍ය ලිබරල් කරණය සමඟ වඩ වඩාත් ඒකාබද්ධ කරමින් මූල්‍ය කේන්ද්‍රස්ථානයක් බවට පත්කරන බවයි. මේවා ඉටු කිරීම සඳහා විශ්‍රාම වැටුප් හා රක්ෂණ අරමුදල් සහ දේපළ වෙළඳාමට අදාළ වත්කම් කළමණාකරණය ඉක්මන් කිරීම සඳහා දියුණු කිරීමට මූල්‍යමය උපකරණ පාවිච්චිය කිරීම තුළින් ඉටු කර ගන්නා බවයි. මේ මූල්‍ය කරණ ක්‍රියාවලිය තුලින් ගෝලීය ප්‍රාග්ධනය ඒ තුළින් සපයා ගැනීමට සැලසුම් කරන බවද පවසා සිටියා. මේ සැලසුම් සියල්ල කඩවුන පොරොන්දු බවට පත් වී තිබෙනවා.

වර්තමානය වන විට ආණ්ඩුව මුහුණ දෙන මූල්‍ය අර්බුදය හමුවේ ජාතික සැලසුම් සියල්ල බිඳ වැටෙමින් තිබෙන නිසා ඉදිරි පළාත් පාලන මැතිවරණයෙන් බලයට පත්වන පළාත් පාලන ආයතනවල ඇත්තේ දැවැන්ත අභියෝගයක්,

## ජාවාරම්කාර බලවේගවලට යට වු ග්‍රාමීය සහ නාගරික සංවර්ධනය

පසුගිය දශක කීපය තුළ නගර සභා සහ ප්‍රාදේශීය සභා මගින් සංවර්ධනයේ නාමයෙන් කරනු ලැබු බොහෝ ව්‍යාපෘති අසාර්ථක වී තිබෙනවා. මේ ව්‍යාපෘති අතර නාගරික හා ග්‍රාමීය ඇතැම් අතුරු මාර්ග ප්‍රතිසංස්කරණය කිරීමේ නියමිත සැලැස්මක් අනුව සිදු වුනේ නෑ. අතුරු මාර්ග කාපට් කිරීම, කොන්ක්‍රීට් දැමීම සඳහා වෙන්කරන ලද මුදල්වලින් සියයට 60 ක් පමණ වැය කර ඉතිරි සියයට 40 කොන්ත්‍රාත් කරුවාත් සහ මන්ත්‍රීවරයා ගසාකෑවා. මේ නිසාම වසර කිහිපයක් යන විට මාර්ග නැවත කැඩී බිඳී යන්නට පටන් ගත්තා. කැලෑ කැපීම ගංගාවල පතල් වනසමින් වැලි ගොඩ දැමීම ලාභ උපයන ජාවාරම් බවට පත්කර ගත්තා. මෙලෙස ස්වභාව ධර්මයේ උරුමයන් වනසමින් කරගෙන යන පරිසර විනාශය නිසා වාර්ෂිකව ගංවතුර ගැලීම කඳු නාය යෑම් නිරන්තර ඇති වෙමින් තිබෙනවා. මෙනිසා සෑම වසරකම මිනිසුන්ට ජීවිතවලින් වන්දි ගෙවීමට සිදු වෙනවා. නාගරික සහ ග්‍රාමීය මාර්ගවල කාණු පද්ධතිය පවිත්‍ර නොකිරීම නිසා වැසි දිනවල මාර්ග යට වෙනවා. බොහෝ නගරවල වැසිකිළි පහසුකම් නෑ. මෙලෙස අසාර්ථක වී තිබෙන නාගරික සහ ග්‍රාමීය සංවර්ධනයට වගකිව යුත්තේ කවුද ? නැවත ඡන්දය ඉල්ලා සිටීමට ද පාලකයින්ට සදාචාරාත්මක අයිතියක් නෑ.

## නව මැතිවරණය ක්‍රමය තුළ බිහිවන මන්ත්‍රීවරයාගේ වගකීම


මෙවර මැතිවරණය තුළ නගරයකට ගමට වගකියන ජනතාවට සමීප නියෝජිතයෙකු පත්කර ගැනීමට අවස්ථාව ලැබී තිබෙනවා. ඔබට නිතර හමුවන මෙම නියෝජිතයාට පුද්ගලිකව තිබෙන සමීපතා අනුව ඡන්දය ලබා දීමට බොහෝ විට ඔබ කටයුතු කිරීමට පුළුවන. ඒත් ඔහු නියෝජනය කරන දේශපාලන පක්ෂයේ ඉතිහාසය භාවිතය මෙහිදී අවධානයට යොමුකරන්න. දේශපාලන ව්‍යාපාරික හා ජාවාරම් බවට පත් කරගත් නියෝජිතයාට ඔබේ ඡන්දය ලබා දීමෙන් ගම හෝ නගරය සංවර්ධනය වන්නේ නෑ.

ඡන්දය ලබාදීමට පෙර ඡන්දය ඉල්ලා සිටින පක්ෂයට හෝ කණ්ඩායමට ගම නගරය සංවර්ධනය කිරීමට සැලැස්මක් තිබේදැයි අවධානයට ලක් කරන්න. රට ව්‍යසනයට ඇද දමා තිබෙන ධනපති පක්ෂවලට ගම හෝ නගරය සංවර්ධනය කිරීමට නොහැකි බව ඔවුන්ගේ ඉතිහාසයේ විසින් සනාථ කර තිබෙනවා. මෙවන් සංකීර්ණ සමාජ පසුබිමක් තුළ ශ්‍රී

ලංකාවේ සමාජවාදී පක්ෂය පහත සඳහන් සංවර්ධන වැඩ පිළිවෙළක් සඳහා සටන් වැදීමට කටයුතු කරමු.

- නාගරික සහ ග්‍රෘමීය ප්‍රදේශවල ජනතාව මුහුණ දෙන සංවර්ධනයේ ගැටළු හඳුනා ගැනීමට එම ප්‍රදේශවල ජනතාව සමඟ කතිකාවතට මුල පිරීම. මෙම කතිකාවලදී එම ජනතාවගේ අදහස් හා යෝජනා ගැඹුරින් සැලකිල්ලට ගෙන ඒවාට ප්‍රමුඛත්වය ලබා දීම.
- මාර්ග ඉදි කිරීම, ප්‍රතිසංස්කරණය කිරීම, ඇල වේලි තැනීම සඳහා ලැබෙන ප්‍රතිපාදක මුදල් ගමේ නගරයේ ජනතා කමිටු මඟින් ක්‍රියාවට නැගීම, මන්ත්‍රිවරයාගේ කැමැත්ත පරිදි කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමට කටයුතු නොකිරීම, එම කොන්ත්‍රාත් ඉහත කමිටුවේ අධීක්ෂණය අනුව සිදු කිරීම.
- ඉහත ව්‍යාපෘති සඳහා ලැබෙන මුදල් ගැන අයවැය වාර්තාවක් ජනතාවට ලබා දීම.
- වනාන්තර එළි පෙහෙළි කිරීම, ගස් කැපීම, ගංගාවල පස් ගොඩ දැමීම මඟින් පරිසරයට වන හානි වැළැක්වීම.
- පරිසරය සුරකින වැඩ පිළිවෙළක් වෙනුවෙන් පෙනී සිටීම.
- නගරයේ ගමේ කුණු කසළ ක්‍රමවත් ලෙස ඉවත් කිරීම හා ඒවා කාබනික පොහොර බවට පත් කර ගැනීම.
- මාර්ගවල කාණු පද්ධතිය නිරන්තර පවිත්‍ර කිරීම.
- ප්‍රාදේශීය අමුද්‍රව්‍ය පදනම් කර ගත් නිෂ්පාදන ක්‍රියාවලියක් තුළින් රැකියා උත්පාදන කරමින් ජනතාවට හිතකර පරිදි සැලසුම් කිරීම හා කුණු ප්‍රතිචක්‍රීය කරනය කිරීම.
- ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රී කොට්ඨාශය නියෝජනය වන පරිදි ජනතා සභාවක් පිහිටුවා එම සභාවට මන්ත්‍රී වැටුප පරිත්‍යාග කිරීම.
- ඉහත සඳහන් මුලික කරුණු මත පදනම් වෙමින් මහජන මුදල් ගසා කන කොන්ත්‍රාත්කරුවන්ට හා ජාවාරම්කාර බලවේග වලට ඉඩ නොදීම. මෙම සමාජ පසුබිම තුළ ජනතා විශ්වාසය බිඳ දැමූ අලි බාබා සහ හොරු 225 පන්නා දමමින් ජන අරගලයට පනපොවන බලයක් සඳහා සියලු ධනපති පක්ෂවලට එරෙහිව ගම හා නගරය සංවර්ධණය කිරීමට නිර්මාණාත්මක දැක්මක් ඇති ශ්‍රී ලංකාවේ සමාජවාදි පක්ෂය සමඟ අත්වැල් බැඳගන්නා ලෙස අප ඔ ඉල්ලා සිටිමු.

ශ්‍රී ලංකාවේ සමාජවාදී පක්ෂයේ බැලුනය ලකුණට ඔබගේ ඡන්දය ලබා දෙන ලෙස අප ඔබට ආයාචනය කරමු.



# ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාවට තරඟකරන අපගේ නියමුවෝ

**පේමචන්ද්‍ර විතානවසම්**



**ඒ.එච්.එම්.සරූක්**



**ඇම්.ඩී. උපුල් සංජය**



**එම්.ඩබ්. සිරිසේන**



**එම්.ඩබ්. චන්ද්‍රිකා**



**සුනිල් විතාන**



**පී.ශෂිකලා මිහිරානි**



**කේ.බී.එම්. ජයලත් ඉන්ද්‍රසි බණ්ඩාර**



**ජේ.ඩබ්.ඒ.සමන්ත වෙත්තසිංහ**

**රිස්වාන්**